# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන<br>தொலைபேசி: **(94) 011- 2696211-13**<br>Telephone **(94) 011- 2166000** | ෆැක්ස්<br>தொலைநகல்: **(94) 011- 2695279**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: **information@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |
|---|---|---|---|


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PS/GT/2020 (IIIවෙළුම) | ඔබගේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2022.01.07 |

අමාත්‍යාංශ ලේකම්වරුන්/ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020</u>**
**<u>ඒකාබද්ධ සේවාවේ ස්ථිර පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන් සහ ස්ථිරව පුහුණු සේවා ස්ථානවලට අනුයුක්තවන අභ්‍යාසලාභීන් රාජකාරි භාර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2022.01.03 දිනැති ලිපියට අවධානය යොමු කරවමි.

02. ඒ අනුව උක්ත වැඩසටහන යටතේ 2022.01.03 දින සිට සංවර්ධන නිලධාරි සේවයේ ස්ථිර පත්වීම් ලබන නිලධාරීන් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථාන එම නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා පහත සබැඳිය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- https://bit.ly/3zzQ1YH

03. එසේම ඔබ විසින් සිදු කරන ලද කාර්යය මණ්ඩලවල අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගෙන ඔබ ආයතනය වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ නාම ලේඛනය පහත සබැඳියට ප්‍රවේශ වීමෙන් ලබා ගත හැකිය.

- https://bit.ly/3G2JmZy

04. එසේම රාජකාරියට වාර්තා කිරීමේ දී සහ රාජකාරි භාර දීමේ දී නිලධාරීන් මෙන් ම ආයතන ප්‍රධානීන් MISCO පද්ධතිය භාවිතා කළ යුතු ආකාරය දැක්වෙන තාක්ෂණික උපදෙස් ද ඉහත සබැඳිවලට ප්‍රවේශවීමෙන් වෙන වෙන ම ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

05. නිලධාරීන් සඳහා රාජකාරි භාර දීමට සුදුසු කාල සටහනක් ඔබගේ පහසුව පිණිස යෝජනා කර ඇති අතර, එපරිදි කටයුතු කරන්නේ නම් පද්ධති අවහිරතාවයකින් තොරව නිලධාරීන්ට රාජකාරි භාර දීමේ කටයුත්ත සිදු කළ හැකි බව සැලකුව මැනවි.

**සටහන -** කිසියම් සුවිශේෂී තත්ත්වයක් තුළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් අන්‍ය ආකාරයක සැලැස්මක් තුළ රාජකාරි භාර දීමට සැලසුම් කරන්නේ නම්, ඒ සඳහා ඉහත කාල සටහන බාධාවක් කර නොගන්නා ලෙස ඉල්ලා සිටින නමුත් MISCO පද්ධතියේ රාජකාරි භාර ගැනීම සටහන් කිරීම සහ එමගින් බාගත කර ගන්නා ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 03 සහ 04 පරිශිෂ්ට මෙම කටයුත්ත යොදා ගැනීම අනිවාර්ය කරුණක් බව සලකන්න.

06. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ කැඳවීම අනුව නව සේවා ස්ථානවලට වාර්තා කරන ලෙස නව පත්වීම්ලාභී නිලධාරීන් දැනුවත් කර ඇත.

07. මෙම වැඩසටහන තුළ යම් පුද්ගලයෙකුගේ සේවා ස්ථානය දර්ශනය නොවීම සහ පත්වීම් ලිපියක් නොලැබීම කෙරෙහි පහත කරුණු බලපෑ හැකිය.

i. අභ්‍යාසලාභින් විසින් දත්ත කිසිවක්ම ඇතුළත් කර නොතිබීම සහ ඇතුළත් කළ දත්ත අසම්පූර්ණ වීම.

ii. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කරන ලද යාවත්කාලීන කිරීම්වල ගැටලු

iii. අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධව වැඩිදුර සිදු කරන ලද විමසීම්වලට අදාළව ලේඛන භාර නොදීම වැනි කරුණු

iv. පළාත් සභා (Province)/ පළාත් සභා පාසල් (Provincial School), ජාතික පාසල් (National School) සහ රාජ්‍ය සේවය (Public) අතර නිශ්චය කිරීම්වල ගැටලු

v. විශාල සංඛ්‍යාවක දත්ත සමග කටයුතු කිරීමේ දී ඇතිවන තාක්ෂණික දෝෂ

08. මෙම වැඩසටහන යටතේ නිලධාරීන්ට රාජකාරි භාරගැනීමට ප්‍රමාණවත් කාලයක් පත්වීම් ලිපියේ විධිවිධාන මගින් ලබා දී ඇති බැවින් ඉදිරි සතියක පමණ කාල සීමාව තුළ ඉහත ගැටලු නිරාකරණය කර සුදුසුකම් සැපිරූ සියලු අභ්‍යාසලාභින්ට ස්ථිර පත් වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

09. ඉහත ගැටලු නිරාකරණය සඳහා යොදා ගන්නා සාධාරණ කාලසීමාව තුළ රාජකාරි භාර ගැනීමේ දී නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවනු ඇත.

10. 2022.04.01 දිනැතිව ඒකාබද්ධ සේවයේ ස්ථිර පත්වීම් ලැබීමට නියමිත අභ්‍යාසලාභින් 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පදනමින් සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමේ ලිපි ද අදාළ දිස්ත්‍රික් ලේකම්වරු වෙත යැවීමට කටයුතු කර ඇති අතර එම අභ්‍යාසලාභින් අදාළ ලිපිය ලද පසු එම සේවා ස්ථානවලින් නිදහස්ව නව සේවා ස්ථානවලට යොමු විය යුතු වේ. එම අභ්‍යාසලාභින්ගේ රාජකාරි වාර්තා කිරීම් MISCO පද්ධතිය භාවිතයෙන් සිදු නොකෙරේ.

**සැලකිය යුතුයි** - මෙම අභ්‍යාසලාභීන් අතරින් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇති අභ්‍යාසලාභීන් එම අමාත්‍යාංශය වෙතින් කැඳවීමක් ලැබෙන තෙක් තාවකාලිකව දැනට සිටින පුහුණු සේවා ස්ථානවල රැඳී සිටිය යුතුය.

11. මෙම කරුණ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2022.01.03 දිනැති ලිපියේ 4, 5 සහ 6 ඡේදවල සඳහන් කරුණු කෙරෙහි නැවත් වරක් විශේෂ අවධානය යොමු කරවමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය